( 19 )

# සංස්කෘතිය, තාක්ෂණය හා මානව පරිණාමය

ආර්.එම්. මල්ෂා මධුශානි රණසිංහ
සිව්වන වසර
rm.malsharanasinghe@gmail.com

හැඳින්වීම

මිනිසා සමාජීය සත්ත්වයෙකු වන අතර සෑම මිනිසෙකු ම තම සංස්කෘතිය නියෝජනය කරනු ලබන නියෝජිතයෙකු ලෙස සැළකේ. සංස්කෘතියක් හිමි ව පවතින එක ම සත්ත්වයා වන්නේ ද මිනිසා ය. අදින් වසර මිලියන හතරකට පමණ පෙර විසූ ඔස්ට්‍රොලොපිතකස් මානවයාගේ සිට වර්තමානයේ ජීවත්වන හෝමෝ සේපියන් හෙවත් නූතන මානවයා දක්වා සිදු වූ තාක්ෂණික වෙනස්කම් මගින් මිනිසාගේ සංස්කෘතික හැකියාවන් වර්ධනය වී තිබේ. සංස්කෘතිය යනු කුමක්ද?, සංස්කෘතියේ ලක්ෂණ, සංස්කෘතිය හා සමාජය, සංස්කෘතියේ අන්තර්ගතය, සංස්කෘතියේ කාර්ය භාරය සහ ඔස්ට්‍රොලොපිතකස් මානවයාගේ සිට නූතන මානවයා තෙක් තාක්ෂණය සමග සංස්කෘතික විකාශනය සිදු වූ අයුරු මෙහි දී සාකච්ඡාවට බඳුන් කෙරේ.

**මානව පරිණාමය හා තාක්ෂණය**

මානවවංශ විද්‍යාවේ පියා ලෙස සැළකෙන එඩ්වඩ් ටේලර් සංස්කෘතිය නිර්වචනය කොට දක්වා ඇත. මොහුට අනුව සමාජයේ සාමාජිකයෙකු ලෙස මිනිසා විසින් අත්පත් කරගත් හැකියා හා චර්යාවන් සංස්කෘතිය වේ. මොහු මෙහි දී හැකියා හා චර්යා ලෙසට හඳුන්වා ඇත්තේ විශ්වාස, දැනුම, ඇදහිලි කලාව, නීතිය, ආචාර ධර්ම, සිරිත් විරිත් හා චාරිත්‍ර වාරිත්‍ර වේ (Tylor, 1871).

සෑම සමාජයකට ම ආවේණික වූත් අනන්‍ය වූත් සංස්කෘතියක් ඇත. සංස්කෘතිය යනු උගත් දෙයකි. සමාජය තුළ අන්තර්ගත චර්යාවන් සියලු දේ මිනිසා විසින් උගත් දෑ වේ. සංස්කෘතිය සමාජයේ නිර්මාණයකි. මෙය හුදෙකලා වූ දෙයක් නො වේ. සංස්කෘතිය සමාජයේ අන්තර් ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් ලෙස සම්භවය ලබා සංවර්ධනය වී ඇත. ආර්ථිකමය වශයෙන්, නීතිමය වශයෙන්, ආගමික වශයෙන්, ඥාතීත්වය වශයෙන් සංස්කෘතිය එකට බැඳී ඇත. සංස්කෘතිය සමාජයේ සත්ත්වයින් විසින් හුවමාරු කරගනු ලැබේ. මානව සමාජයේ මිනිස් ගති වර්ධනය කරගැනීමට සංස්කෘතිය ඉවහල් වේ. මිනිසාට සංස්කෘතිය ප්‍රතික්ෂේප කරනු ලබන කිසිඳු දෙයක් අත්පත් කරගත නො හැකි ය. දෙමාපියන්ගෙන් තම දරුවන්ට ද ඔවුන්ගෙන් ඉදිරි පරම්පරා වලට ද සංස්කෘතිය සම්ප්‍රේෂණය වේ. භාෂාව මාධ්‍ය කර ගනිමින් එම කාර්යය ඉටු වෙයි. සංස්කෘතියේ කිසිඳු දෙයක් තනි ව ම අත්පත් කරගත නො හැකි ය. එම නිසා සංස්කෘතිය යනු පොදු දෙයකි. භාෂාව, වටිනාකම්, විශ්වාස, ඇදහිලි ආදී වූ සංකේතාත්මක ලක්ෂණ

සංස්කෘතියක් තුළින් නිරූපණය වේ. කෙසේ නමුදු සංස්කෘතිය වෙනස් වන සුළු ය. මිනිසාගේ අවශ්‍යතා මත සංස්කෘතිය නිරන්තරයෙන් වෙනස්වීම් වලට ලක් වේ. ඕනෑ ම සංස්කෘතියක් කාලයත් සමඟ වෙනස්වීම් වලට භාජනය වේ.

සමාජය ගොඩනැගී ඉන් අනතුරු ව සංස්කෘතිය ගොඩනැගේ. සමාජයක සාමාජිකයන් විසින් සිදුකරනු ලබන චර්යා දාමයන් තුළින් සංස්කෘතිය නිරූපණය වේ. සමාජයේ සාමාජිකයින්ගේ අන්තර් ක්‍රියා තීරණය වන්නේ ඔවුන්ගේ සංස්කෘතියට අනුවයි. සමාජයක් තුළ සංස්කෘති කිහිපයක් තිබිය හැකි ය. ඔවුන්ගේ ආගම්, ආර්ථික, විවාහ වැනි විවිධ සංස්ථා විවිධත්වයෙන් යුත් සංස්කෘතික ලක්‍ෂණ ඉන් පෙන්නුම් කරනු ලැබේ. සංස්කෘතිය මගින් ප්‍රතික්ෂේපිත ක්‍රියාවන් සමාජය තුල දී සිදුකිරීම අප්‍රසාදයට ලක්වන කරුණක් ලෙස සළකනු ලැබේ. යම් යම් අවස්ථා වල දී සංස්කෘතියට පටහැනි ක්‍රියාවන් සමාජයේ දී සිදු නොවන්නේ යැයි ස්ථිර ව ම ප්‍රකාශකළ නො හැකි ය.

සෑම සමාජයකට ම සංස්කෘතියක් හිමි නමුත් සෑම සංස්කෘතියක් ම සමාන නො වේ. නමුත් ඒවායෙහි අන්තර්ගතයන්හි යම් යම් කරුණු පොදු සමානතා දරණ බව පෙනී යයි. පොදුවේ සියලු සංස්කෘතීන්ට ආවේණික වූ සිරිත් විරිත් සම්ප්‍රදායක් හඳුනාගත හැකි වේ. මිනිසා සංස්කෘතියක් තුළ තමාට අනන්‍ය වූ ආගමක් අදහයි. ආගම වෙනස් නමුදු සංකල්පය සමාන ය. ඕනෑම සංස්කෘතියක් තුළ මිනිසුන්ගේ ජීවනෝපාය මාර්ගයක් දක්නට ලැබේ. ආගම් අනුව, සම්පත් අනුව, පරිසර තත්ත්ව අනුව මෙම ජීවනෝපාය ක්‍රමයන් විවිධ වුවත් සංකල්පය අනුව ඕනෑම සංස්කෘතියකට පොදු ය.

මිනිසා විසින් නිර්මිත පරිසරය භෞතික සංස්කෘතිය ලෙස හඳුන්වයි. ශිෂ්ටාචාරය ලෙස හඳුන්වනු ලබන්නේ ද මෙසේ මිනිසා විසින් නිර්මාණය කළා වූ භෞතික පරිසරයයි. උපකරණ, ජනාවාස, වාරිමාර්ග, මහාමාර්ග, මෙන් ම එදිනෙදා පරිහරණය කරන්නා වූ මිනිසා විසින් නිර්මාණය කරනු ලබන කුමන හෝ දෙයක් වේ නම් එය භෞතික සංස්කෘතියට අයත් වේ. මිනිසා විසින් භාවිතා කරන්නා වූ භාෂාව, ඇදහිලි, විශ්වාසයන්, අනුගමනය කරන්නා වූ සාරධර්ම අභෞතික සංස්කෘතිය ලෙස සැළකේ. මිනිසා සිතන පතන ආකාරය හා හැසිරෙන ආකාරය, අභිචාරයන්හි නියතු ආකාරයත්, චාරිත්‍ර වාරිත්‍ර, ආගමික විශ්වාසයන් යන සියලු දේ අභෞතික සංස්කෘතියේ අන්තර්ගතයන් වේ.

සංස්කෘතියේ කාර්යභාරය පිළිබඳ විමසා බැලීමේ දී මිනිසාට සංස්කෘතියෙන් තොරව පැවැත්මක් තහවුරු කරගත නො හැකි බව පෙනී යයි. සංස්කෘතිය විසින් විවිධ වූ කාර්යයන් රාශියක් ඉටුකරනු ලැබේ. මිනිසා නිරන්තරයෙන් ම තමන්ගේ අවශ්‍යතා හා හැකියා වලට අනුකූල ව ජීවත්වන පරිසරය නිර්මාණය කර ගන්නා අතරම පරිසරයට අනුගතවීමක් ද පෙන්නුම් කරයි. මෙහි දී සංස්කෘතිය මිනිසාට අවශ්‍ය දැනුම ලබාදේ. මෙසේ ලබාදෙන්නා වූ දැනුම මිනිසා භාෂාව මාධ්‍ය කර ගනිමින් මීළඟ පරම්පරාවට අභිප්‍රේරණය කරනු ලබයි. මිනිසා සිදුකළ යුත්තේ මොනවාද? ප්‍රතික්ෂේප කළ යුත්තේ මොනවාද? යන්න සංස්කෘතිය මගින් තීරණය කරනු ලබයි. බොහෝවිට මිනිසාගේ හැකියාවන් තීරණය කරනු ලබන්නේ ද සංස්කෘතිය

විසිනි. වෘත්තීමය වශයෙන් යොමුවන්නා වූ ක්ෂේත්‍රය පිළිබඳ පූර්ව නිගමනයක් සංස්කෘතිය තුළින් ලබාදේ. විවිධාකාර ආගමික සංස්කෘතීන් මෙසේ හැකියාවන් තීරණය කරනු ලබයි.

සෑම සංස්කෘතියක් ම එයට ම ආවේණික පෞර්ෂත්වයක් ගොඩනැගීම සිදුකරනු ලබයි. සමාජය තුළ ක්‍රියාකාරී වීමේදී මිනිසුන් තුළින් ඉස්මතු වන්නේ සංස්කෘතිය මඟින් ගොඩනැගුවා වූ පෞර්ෂත්වයයි. සංස්කෘතිය මඟින් ප්‍රතික්ෂේප කරන්නා වූ කාර්යයන් සිදුකිරීම පෞර්ෂත්වයට හානි සිදුකර ගැනීමකි. මිනිසා කළ යුතු දේ නොකළ යුතු දේ අවධාරණයට ලක්කරනු ලබන්නේ සංස්කෘතිය විසිනි. මිනිසාගේ හැසිරීම් රටාවන් හැඩගැස්සවීම උදෙසා කරුණු නිර්ණය කරන්නේ ද, සීමා මායිම් පනවන්නේ ද සංස්කෘතියයි. මෙහිදී සම්මතයන්ට ප්‍රශංසා ලබාදෙන අතර අසම්මතයන්ට දඬුවම් ලබාදේ.

සංස්කෘතියක් හිමි ව පවතින එක ම සත්ත්වයා වන්නේ මිනිසා ය. මානවයාගේ සංස්කෘතික විකාශන ක්‍රියාවලිය මානවයා ඒ ඒ කාල වකවානු වලදී යොදාගත්තා වූ තාක්ෂණය සමඟ බද්ධ වී ඇත. මානව වර්ගයාගේ පරිණාමය කවදා කෙසේ සිදුවී ද යන්න නිශ්චිතව ම පෙන්වා දීමට නොහැකි සේම සංස්කෘතියේ පරිණාමය ද කවදා කෙසේ කොතැනක දී ආරම්භ වූයේ ද යන්න නිශ්චිත ව ම ප්‍රකාශ කළ නො හැකි ය. කෙසේ නමුත් සංස්කෘතිය බැඳී පවතින්නේ මානව පරිණාමය සමඟ ය. මානව පරිණාමයේ හා සංස්කෘතියේ විකාශනය ගොඩනැගීමේ දී එකල සමාජයේ වූ තාක්ෂණය එයට සෘජු ලෙස ම අදාළ වී ඇති බව පෙනේ. තාක්ෂණය මඟින් මිනිසාගේ සංස්කෘතික හැකියාවන් හා ජෛවීය හැකියාවන් වර්ධනය කරන අතර පරිසර තත්ත්වයට හා පාරිසරික උපයෝගීතාවයන්ට අනුකූල ව තාක්ෂණය තීරණය වේ. එනම් සාම්ප්‍රදායික දැනුම පරිසරයට අනුකූල ව නිර්මාණය වේ. මිනිසා පරිසරය තුළ සිදුකරන කටයුතු වලින් තාක්ෂණය බිහි වී තාක්ෂණය මඟින් සංස්කෘතිය බිහි වේ. මෙම තාක්ෂණය සියලු සමාජ චර්යා හා සමාජ සම්බන්ධතා සමඟ බද්ධ වේ. පරිසරය තුළ වඩාත් තාර්කික ව ජීවත්වන්නට මිනිසා ගන්නා ප්‍රයත්නය තාක්ෂණයෙන් පිළිබිඹු වේ. තාර්කික හැසිරීම අඩු ශ්‍රමයට හා වැඩි ඵලදායීතාවයට හේතුවක් වන අතරම සංස්කෘතිය සම්ප්‍රේෂණය වන වාග් මාලාව තුළින් එම සමාජය සතු තාක්ෂණය නිරූපණය වේ.

නිර්මාණශීලීත්වය හා නව්‍යජනන ක්‍රියාවලිය තුළින් තාක්ෂණය බිහි වේ (Gierer, 2004). ඔස්ට්‍රොලොපිතකස් මානවයාගේ සිට හෝමෝ සේපියන්ස් මානවයා දක්වා සිදු වූ මානව පරිණාම ක්‍රියාවලියේ දී සංස්කෘතික හා තාක්ෂණික වර්ධනය කෙරෙහි සෘජු ව ම බලපෑ කාරණය වන්නේ මානවයාගේ කපාල ධාරිතාවේ වර්ධනයයි (එම). බාහිර දැනුම උත්තේජනය හා ජාන සැකැස්ම නිසා මොළයේ විවිධ ස්ථාන විවධ අවස්ථා තුළ උත්තේජනය වේ. මෙහි දී සිදුවන හෝමෝන හා රසායනික ක්‍රියාවලියක් නිසා මොළයේ සමහර ස්නායු විශේෂයෙන් වර්ධනය වේ. මානව පරිණාම ක්‍රියාවලියේ දී මිනිසාගේ සිදු වූ මෙම ජෛවීය වෙනස්කම් අනුව තාක්ෂණය ගොඩනැගී ඒ තුළින් සංස්කෘතිය නිර්මාණය විය. සංස්කෘතියක් තුළ යම්කිසි පුද්ගලයෙකු අලුත් ම දෙයක් නිපදවීම නව්‍යජනනය ලෙස හඳුන්වයි. මේ සඳහා කාල්පනික හැකියාව හා නිර්මාණශීලීත්වය බලපානු ලැබේ.

වසර මිලියන 4 කට පෙර අප්‍රිකාවේ බිහි වූ ඔස්ට්‍රොලොපිතකස් මානවයා මානව පරිණාමයේ පළමු පුරුකයි (Harrub, Thompson, 2003). නමුත් සංස්කෘතිය යන්න ඔස්ට්‍රොලොපිතකස් මානවයාගේ බිහිවීමත් සමඟ ආරම්භ වූවක් ලෙස හැඳින්වීම පදනම් විරහිත ය. තාක්‍ෂණික සංස්කෘතිය සංවර්ධන මට්ටමකට පත්වූ පසු සංස්කෘතිය නැමැති සංකල්පය ක්‍රම ක්‍රමයෙන් හිස ඔසවන්නට ඇති බව පුරාවිද්‍යාඥයින්ගේ පිළිගැනීම වේ. පදනම් ප්ලයිස්ටොසීන යුගයේ දී බිහිවූ මෙම මානව විශේෂය විසින් සකස්කරනු ලැබූ ආයුධ භාවිත කළේ නැත (එම). ඔවුන්ගේ භාවිතය වූයේ ස්වභාවයෙන් ම නිර්මාණය වූ ශිලා ආයුධයි. මේවා ඉතා සරල මෙවලම් ලෙස හඳුනාගත හැකි ය.

අදින් වසර මිලියන 2.8 - 1.5 කට පෙර ජීවත් වූ හෝමෝ හැබිලිස් මානවයා ප්‍රථම ආයුධ සෑදූ මානවයා වේ. මොහු ජීවත්ව සිට ඇත්තේ පහළ ප්ලයිස්ටොසීන අවධියේ ය (Tobias, 1992). මොවුන් විසින් නිර්මාණය කරනු ලැබූ මෙවලම් ඔල්දුවාන් මෙවලම් (Oldowan tools) ලෙසට හඳුන්වනු ලැබේ. මෙම මෙවලම් ප්‍රමාණයෙන් විශාල වන අතර දැඩි රළුබවකින් යුක්ත වේ. මුලින් ම තැලුම් ආයුධ නිර්මාණයටත් පසු ව කැපුම් ආයුධ නිර්මාණයටත් ඔවුන් යොමු වී තිබේ. සමාජ චර්යාවන් සඳහා ප්‍රවේශ වූ හෝමෝ හැබිලිස් මානවයා යම් ආකාරයක කථන කටයුතු කිරීමේ හැකියාවකින් ද යුක්ත වූ බවට උපකල්පනය කරනු ලැබේ.

මානව පරිණාමීය ක්‍රියාවලියේ මීළඟ පරිණාමීය පුරුක වන්නේ හෝමෝ ඉරෙක්ටස් මානවයාය. අදින් වසර මිලියන 1.9 කට පෙර ජීවත් වූ මොහු පුළුල් ව්‍යාප්තියක් දක්වන පලමු හෝමෝ වර්ගයා වේ. අප්‍රිකාවෙන් බිහි වී ලොව පුරා ව්‍යාප්ත වූ මෙම මානවයා විවිධ ශිලා ආයුධ හා සත්ත්ව අස්ථි වලින් මෙවලම් සෑදූ අතර ඒවා යෝග්‍ය පරිදි භාවිත කර තිබේ. ඔවුන්ගේ ආයුධ ගොනුව ප්‍රදේශ අනුව විවිධත්වයක් දක්වන බව පර්යේෂණ වලින් පැහැදිලි වී ඇත. නැගෙනහිර රට වල දී වැඩි වශයෙන් කෙටීමේ ආයුධ (Chopper tools) භාවිතයට ගෙන තිබූ අතර, බටහිර රටවල දී අත්පොරෝ (Hand Axes) භාවිතයට ගෙන ඇත (Rightmire, 1990). සීරීමේ හා කෙටීමේ ආයුධ වඩා පැරණි වුවත් මෙම කාලවකවානුවේ දී අත් පොරව නව තාක්‍ෂණය අනුව හඳුන්වා දී ඇත. මෙහි දී ආචූලියන් (Acheulean) අත් පොරව විශේෂ වේ. ප්‍රංශයේ සෙන්ට් ඇචූලියන් ප්‍රදේශයෙන් මෙම සංස්කෘතිය හඳුනාගනු ලැබූ නිසා මෙය ආචූලියන් සංස්කෘතිය ලෙසට හඳුන්වනු ලැබේ. මෙතෙක් නො දැන සිටි ගින්න නිපදවා ගැනීම මෙම වකවානුවේ දී සිදු වූ සුවිශේෂී සිදුවීමකි (එම) . මෙතෙක් කිසිදු පිළිසකර කිරීමකින් තොරව අනුභව කළා වූ ආහාර සකස් කර ගැනීමට ගින්න ඉවහල් කරගනු ලැබූ හෝමෝ ඉරෙක්ටස් ස්වභාවධර්මයේ බලවේගයන්ගෙන් එල්ලවන තර්ජන වලින් රැකවරණය ලබාගැනීම සඳහා ද ගින්න භාවිතා කරගනු ලැබී ය. සතුන් මරාගැනීම සඳහා එක් ස්ථානයකට ඔවුන් කොටුකිරීමට ද ගින්දර භාවිතකර ඇත (එම). නිවහනක ජීවත් වූ ප්‍රථම මානව කොට්ඨාශය වන්නේ ද හෝමෝ ඉරෙක්ටස් මානවයා ය. ඔවුන් නිවහන ලෙස තෝරාගෙන ඇත්තේ ස්වභාවික ගල් ගුහාවක් හෝ විවෘත භූමියක් ය. කණ්ඩායම් වශයෙන් සාමූහික ව ජීවත්වන්නට ඇතැයි සැළකේ. වාසස්ථාන සාදාගැනීමේ දී දැව භාවිත කළ බවට ද සාක්ෂි ඇත.

මීට පෙර ජීවත් වූ මානව කොට්ඨාස සතුන් දඩයම් කොට ආහාරයට ගෙන නැත. වෙනත් සතෙකු විසින් මරා දැමුණු හෝ මියගොස් සිටින සතුන් ඔවුන්ගේ ආහාරය විය. නමුත් හෝමෝ ඉරෙක්ටස් මානවයා සතුන් දඩයම් කළ ප්‍රථම මානව කොට්ඨාශය විය. චීනයේ ලූංකුෂාන් ප්‍රදේශයේ පිහිටි zhoukoudian ගල් ගුහාවෙන් මොවුන් දඩයමින් ජීවත් වූ බවට සාධක ඇත (එම). පලතුරු සහ ඇට වර්ග ආහාරයට ගත් බවට ද මෙම ගුහාවෙන් සාක්ෂි ලැබී ඇත (එම). මොවුන් කොළ ඉති, සත්ත්ව හම් ආදිය ඇඳුම් ලෙස භාවිත කොට තිබෙන්නේ විලි වසාගැනීමට නොව සීතලින් ආරක්ෂා වීම සඳහා බව උපකල්පනය කරනු ලැබේ. හෝමෝ හැබිලිස් මානවයා යම් යම් කථන හැකියාවන්ගෙන් යුක්ත වූ වත් හෝමෝ ඉරෙක්ටස් මානවයා භාෂාවක් කථා කිරීමේ හැකියාවෙන් යුතු මානවයෙකු බව ඔහුගේ මොල පරිමාව අනුව පුරාවිද්‍යාඥයින් විශ්වාස කරනු ලැබේ. මේ ආදී වූ විවිධ හේතූන් මත හෝමෝ ඉරෙක්ටස් මානවයා වටා උසස් සමාජීය ලක්ෂණ හා සංස්කෘතියක් තිබෙන්නා ඇතැයි උපකල්පනය කෙරේ (එම).

මානව පරිණාමයේ මීළඟ පුරුක වන්නේ හෝමෝ සේපියන් නියන්ඩතාල් මානවයා ය. අදින් වසර ලක්ෂ 3-2 කට පෙර සිට වසර 20,000 කට පෙර දක්වා ඔවුන් ජීවත් වී ඇත. හෝමෝ ඉරෙක්ටස් කාණ්ඩයකින් ඔවුන් පරිණාමය වූ බව මානව විද්‍යාඥයින් විශ්වාස කරන අතර, මොවුන්ගේ තාක්ෂණය වූයේ පැති සීරුම් උපකරණ ප්‍රධාන කර ගත් ක්‍රමවේදයකි. මෙය මුස්ටීරියන් (Mousterian) ප්‍රදේශයෙන් හමු වූ නිසා මුස්ටීරියන් සංස්කෘතිය ලෙස හඳුන්වනු ලැබේ. මෙම සංස්කෘතියේ ප්‍රධාන කොටස් තුනකි. එක් පැත්තක පමණක් පතුරු ගැල වූ ශාක පත්‍ර හැඩගත් උල් ආයුධ, පැත්තක පමණක් පතුරු ගැල වූ හෙලි ආයුධ, පැත්තක පමණක් පතුරු ගැල වූ අත්පොරෝ මෙහි ප්‍රධාන ගල් ආයුධ වර්ග වේ (Mellars, 1996). මුස්ටීරියන් ආයුධ නිෂ්පාදකයින් Levallois තාක්ෂණය භාවිත කර ආයුධ නිෂ්පාදනය කිරීම විප්ලවීය වෙනසක් ලෙසට පිළිගනු ලැබේ. ඇයුරිග්නෙසියන් (Aurignacian tools) නම් මෙවලම් සම්ප්‍රධාය මුස්ටීරියන් සංස්කෘතියේ විකාශනයකි. මුල් ම ආභරණ, සංගීත භාණ්ඩ නිර්මාණය කොට ඇත්තේ නියැන්ඩතාල් මානවයා විසිනි. මොවුන් විසින් සරල කුඩාරම් භාවිතකර ඇත. මළවුන් භූමදානය කිරීමේ මූලිකයන් වූයේ ද නියැන්ඩතාල් මානවයා ය. ඉරාකයේ ශනිදාර් ගුහාව මේ පිළිබඳ සාක්ෂි සපයයි (එම).

අදින් වසර 10,0000 කට පෙර සිට පරිණාමය වීම ආරම්භ ව වර්තමානය දක්වා ජීවත් වන මානව විශේෂය වන්නේ හෝමෝ සේපියන්ස් මානවයා ය. මොහුගේ බිහි වීම සහ පරිණාමය පිළිබඳ අදහස් දෙකකි. එනම් බහු ප්‍රදේශ වල බිහිවීම සහ ඔවුන් කාලයත් සමඟ මිශ්‍රවීම හා අප්‍රිකාවේ සම්භවය ලබා එයින් පිටව යෑමේ න්‍යායයි (Johanson, Donald, 2008). මෙම අවස්ථාවේ සිට මානවයා ශාරීරික පරිණාමයට වඩා සංස්කෘතික පරිණාමයක් පෙන්වයි. මෙකල සමාජ ජීවිතය තරමක් නවීන වූ නමුත් ප්‍රාථමික එකකි. ශාක හා සත්ත්ව ගෘහාශ්‍රිත කරණය, ලෝහ තාක්ෂණය මඟින් පරිසරය මෙල්ල කිරීම, කාර්මික විප්ලවය, මැටි බඳුන් නිපදවීම, ඇඳුම් මැසීම හෝමෝ සේපියන් පරිණාමයේ මුල් අවස්ථානුගත සිදුවීම් ය. රෝදය නිපදවීම මෙම අවධියේ සිදු වූ වැදගත් සිදුවීමකි. මෙය ඓතිහාසික සමාජයට පදනම විය.

වර්තමානයේ සිටිනුයේ හෝමෝ සේපියන් මානවයාගේ උප විශේෂයක් වන හෝමෝ සේපියන් සේපියන් මානව විශේෂයයි. මොවුන්ට පරිසරයට උචිතව භාවිත කිරීමට හා අවශ්‍යතාවයන්ට ගැළපෙන සඳහා මෙවලම් නිෂ්පාදනය කිරීමට හැකි වී ඇත. මව්පියන් හා දරුවන් එක්ව ජීවත් වන න්‍යෂ්ටික පවුල් මොවුන්ගේ සමාජ ඒකකය වේ. ඇදහිලි හා විවිධ භාෂා භාවිතය මොවුන් තුළින් හඳුනාගත හැකි ය. ලේඛනමය හැකියාවන් වැඩිදියුණු වීම හා පරිසරය වෙනස්කිරීමේ හැකියාව මොවුන් සතු වූ බව වර්තමානය වනවිට පරිගණක තාක්‍ෂණය දක්වා මිනිසා දියුණු වීම තුළින් හඳුනාගත හැකි වේ.

**සමාප්තිය**

මුලින් ම මිනිසා පරිසරයට යටත්ව ජීවත් වුව ද පසුව තමාගේ අවශ්‍යතා අනුව පරිසරය මෙල්ල කොට නිර්මාණය කර ගත්තේ ය. එනම් ක්‍රම ක්‍රමයෙන් මිනිසා පරිසරය ජයග්‍රහනය කිරීමට සමත්විය. මේ සඳහා ඉවහල් වූ කරුණු ලෙසට මානව විද්‍යාඥයින් සඳහන් කරනු ලබන්නේ මිනිසාට අත් පා සහ විශාල මොළයක් තිබීම, හස්ත කුසලතා මගින් ද්‍රව්‍යමය ආයුධ නිපදවීම හා ඒවා ප්‍රයෝජනයට ගැනීම, විශ්වාස ඇදහිලි කරා මිනිසා යොමුවීම සහ පෞද්ගලික ශ්‍රම විභජනය සමාජයේ යහපත උදෙසා සාමූහික ව යෙදවිය හැකිවීම යන කාරණා ය (ලගමුව, 2000).

සෑම නව තාක්‍ෂණ නව්‍යජනනයකම ආරම්භක අවධියක්, වර්ධන අවධියක්, හා පරිහානි අවධියක් දක්නට ලැබේ. මේ නයින් පෙනී යන්නේ තාක්‍ෂණය වෙනස්වත්ම සංස්කෘතිය ද එයට අනුකූල ව වෙනස් ව වර්තමානය දක්වා පැමිණ තිබෙන බව ය.

**ආශ්‍රේය මූලාශ්‍ර හා ලිපි නාමාවලිය**

1871, Taylor E. B. ***Primitive Culture,*** London.

1992, Tobias, P.B. ***The species Homo habilis***, ANN.ZOOL.FENNICI Vol.28.

1990, Rightmire, G.P. The Evolution of Homo Erectus, University of Cambridge.

2004, Alfred Gierer, ***Human Brain Evolution, Theories of Innovation, and Lessons from the History of Technology***, MAX-PLANCK-INSTITUT FÜR WISSEN SCHAFT SGESCHICHTE.

2003, Harrub, B. Thompson, B. ***The truth about human origin***, Apologetics Press, Alabama.

2008, Johanson, Donald, http://***www.becominghuman.org/***

1981, නෙස්තුර්හ් එම්. ***මිනිසාගේ සම්භවය***, ප්‍රගති ප්‍රකාශන මන්දිරය මොස්කව්

2000, ලගමුව ඒ, ***ප්‍රායෝගික ක්ෂේත්‍ර පුරාවිද්‍යාව,*** සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ

2003, රත්නසූරිය ඩබ්. ඩී, විජයරත්න එම්. ජේ. එස්, චන්ද්‍රසේකර ඩබ්. යූ, ***පරිණාමය,*** අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ

2004, උඩවත්ත ඒ, ***මානව පරිණාමය***, වාසනා ප්‍රකාශකයෝ, දන්කොටුව

2005, ජයසිංහ ඒ. කේ. පී, ***සමාජ මානව විද්‍යා මූලධර්ම***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

2009, ගුණවර්ධන, පී. අධිකාරි, ජී. ***මානව විද්‍යාව හැඳින්වීම*** , එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.